# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

ටී.එම්.එෆ්.එක්ස්. පීරිස්
121, පන්නල පාර,
දන්කොටුව

**අභියාචක**

**අභියාචනා අංකය :**
**RTIC/Appeal/542/2022**

**එදිරිව**

නාගරික සංවර්ධන අධිකාරිය
6, 7, 9 මහල්,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල

**පොදු අධිකාරිය**

**ඉදිරිපිටදී :**

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
5. මොහොමඩ් නහියා - කොමසාරිස්

**පෙනී සිටීම :**

අභියාචක සූම් තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වේ.

පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ පරිපාලන නිලධාරි වලනි නාරංගොඩ මිය (තොරතුරු නිලධාරි) සම්බන්ධ වේ.

**ලිඛිත සැළකිරීම් :**

අභියාචක - ඉදිරිපත් කර නැත

පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත

**විභාග කළ දිනය :** 2022.09.21

**තීරණය කළ දිනය :** 2022.09.21

## කොමිෂන් සභාවේ තීරණය

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2021.12.23 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

*තොරතුරු ඉල්ලීම*

*නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අංක 10/675 හා 2020.02.29 දිනැති ලිපියට අනුව, හලාවත නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) විසින්, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් වෙත යොමු කල, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා*

*නිර්දේශයට අදාල තොරතුරු සඳහන්, ලිපියේ සහතික පිටපතක් (සිංහල) මා වත ලබා දීමට කාරුණික වන්න.*

*තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 24 වැනි වගන්තිය හා තොරතුරු ලබා ගැනීමේ RTI 01 ඉල්ලුම් පත්‍රය අනුව මෙම ඉල්ලීම ඔබට යොමු කරමි.*

තොරතුරු නිලධාරී විසින් පනතේ දක්වා ඇති නියමිත කාල සීමාවන් තුල ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීම මත අභියාචක විසින් 2022.01.15 දින නම් කළ නිලධාරි වෙත අභියාචනයක් සිදු කර ඇත. නම් කළ නිලධාරිද නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත්වීම මත අභියාචක විසින් 2022.02.17 දිනැතිව කොමිෂන් සභාවට ඉහත අංක දරණ අභියාචනය යොමු ඇත.

**සළකා බැලීම**

දෙපාර්ශවයම ඉදිරිපත් කරන ලද කරුණු සළකා බලන ලදී. තොරතුරු ඉල්ලීමට අන්තර්ගත තොරතුරු ලබා නොදීමට හේතුවක් අන්තර්ගත නොවේ. එබැවින් ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමේ අන්තර්ගත සියලුම 2022.10.15 දිනට ප්‍රථම, කොමිෂන් සභාවටද පිටපත් සහිතව, අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය සහ එහි තොරතුරු නිලධාරි විසින් ක්‍රියා කළ යුතු බවට අපි තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.